(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 2(8).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2023 සැප්තැම්බර් 22 සිකුරාදා

**2023 ඔක්තෝබර් 04 බදාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාවට අනුව, ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව විගණකාධිපතිවරයා පත් කරනු ලබන හෙයින් ද;

විගණකාධිපතිවරයාගේ වැටුප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන අතර එය ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින් ද;

ජනාධිපතිවරයා විසින් 2023 අගෝස්තු 28 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය, 2023 සැප්තැම්බර් 04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී සලකා බලා විගණකාධිපතිවරයාට විශ්‍රාම වැටුප් හිමිකම සහිත දීමනා පහත පරිදි ගෙවීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇති හෙයින් ද:—

(අ) විගණකාධිපතිවරයාට 2019.07.01 දින සිට 2022.12.31 දින දක්වා විශ්‍රාම වැටුප් හිමිකම සහිත රු. 25,000.00 ක මාසික දීමනාව ලබා දීමටත්; සහ

(ආ) එකී රු. 25,000.00 ක දීමනාව 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් හිමිකම සහිත රු. 50,000.00 ක දීමනාවක් දක්වා ඉහළ නැංවීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපතිවරයා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් විශ්‍රාම වැටුප් හිමිකම සහිත දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මැයි 17 දිනැති අංක 2332/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මැයි 20 දිනැති අංක 2332/53 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් වැඩ බලන මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජූනි 22 දිනැති අංක 2337/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජූලි 13 දිනැති අංක 2340/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතය (අංක 1),— රේගු ආඥා පනතේ (235 අධිකාරය) 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2023.09.19 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2023 ජූනි 16 දිනැති අංක 2336/72 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතය (අංක 2),— රේගු ආඥා පනතේ (235 අධිකාරය) 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2023.09.19 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2023 ජූනි 30 දිනැති අංක 2338/54 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතය (අංක 3),— රේගු ආඥා පනතේ (235 අධිකාරය) 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2023.09.19 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2023 ජූලි 21 දිනැති අංක 2341/64 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ නියෝග,— සංශෝධිත (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 107අ(1) වගන්තිය යටතේ තීරු බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 අප්‍රේල් 28 දිනැති අංක 2329/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 27, 36, 37, 39, 40 සහ 64 වගන්ති සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ අදාළ නියාමන අධිකාරීන් විමසා, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජූලි 07 දිනැති අංක 2339/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(1අ) වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 අගෝස්තු 29 දිනැති අංක 2347/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2023 ඔක්තෝබර් 05 බ්‍රහස්පතින්දා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2023 ඔක්තෝබර් 06 සිකුරාදා)**

3678/2023

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1997.01.01 දින සිට 2019.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලද;

(ii) 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලද;

(iii) 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලද;

(iv) 1997.01.01 දින සිට 2021.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලදුව 2021.12.31 දින වනවිට මරණයට පත් වී ඇති;

ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් සංඛ්‍යාව එක් එක් සේවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 1997.01.01 දින සිට 2021.12.31 දින දක්වා කාලය තුළ වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප ලබා ගන්නා ලද පුද්ගලයන් සංඛ්‍යාව ඉහත සඳහන් එක් එක් සේවය සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

---

**2023 ඔක්තෝබර් 17 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

818/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022.05.09 වන දින හා ඊට ආසන්න දිනවල ඇති වූ කලබලකාරී අවස්ථාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු පොදු ජනතාවගේ නිවාස හා දේපළවලට යම් පුද්ගලයන් පිරිසක් විසින් හානි කරන ලද බව දන්නේද;

(ii) එම පුද්ගලයන් සම්බන්ධ වී සිටින දේශපාලන පක්ෂ කවරේද;

(iii) නිවාස හා දේපළ අහිමි වූ එක් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, නගරාධිපතිවරුන්, ප්‍රාදේශීය සභා සභාපතිවරුන්, නගර සභා මන්ත්‍රීවරුන් සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ඇතුළු සාමාන්‍ය පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත දිනවල පොදු දේපළ හානි කිරීමට සම්බන්ධ වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ හානි කරන ලද පොදු දේපළවල වටිනාකම කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් පුද්ගලයන් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

837/2023

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, මධ්‍යම රජයට සහ පළාත් සභාවට අයත් පාසල් අතරින් ගුරු හිඟය පවතින, පානීය ජල පහසුකම්, වැසිකිළි පහසුකම්, විද්‍යාගාර, පුස්තකාල සහ ක්‍රීඩා පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් පාසලේ නම සහ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

852/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රන්මිණිතැන්න, මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි-සිනමා උද්‍යානය පසුගිය රජය විසින් ඉදිකර ජනතා අයිතියට පත් කරන ලද බවත්;

(ii) මේ වනවිට එම උද්‍යානය ඵලදායි ලෙස භාවිතා නොකිරීම හේතුවෙන් එහි සම්පත් විනාශ වෙමින් පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ටෙලි-සිනමා උද්‍යානය ඉදිකිරීම සඳහා ආයෝජනය කරන ලද මුදල කොපමණද ;

(ii) මේ වනවිට ඉහත උද්‍යානයේ රූගත කිරීම් සිදු කරන්නේද;

(iii) එම උද්‍යානයේ ඇති සම්පත් ආරක්ෂා කර ගැනීම සඳහා පවතින වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

872/2023

ගරු රෝහණ බංඩාර මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර නගරයේ "අවන්ති දේවි" නමින් කාන්තා ළමා නිවාසයක් තිබෙන බව දන්නේද;

(ii) ඉහත ළමා නිවාසයේ මේ වනවිට රැකවරණය ලබන ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ළමා නිවාසයේ විවිධ අක්‍රමිකතා සිදු වන බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1333/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාතේ නිෂ්පාදනය කරනු ලබන එළවළු සහ පලතුරු ප්‍රවාහනය කිරීමේදී හා අලෙවි කිරීමේදී සිදු වන පසු අස්වනු හානිය පිළිබඳ ගණනය කර තිබේද;

(ii) එසේ නම්, එම හානිය මූල්‍යමය හා ප්‍රමාණාත්මකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉදිරියේදී පසු අස්වනු හානි වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1719/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2020 සිට මේ දක්වා එම සේවකයන්ට වැටුප් හා දීමනා ගෙවීම සඳහා සහ වෙනත් පහසුකම් ලබා දීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කාල සීමාව තුළ මණ්ඩලයට කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන්ගේ නම් සහ ඔවුන්ට ගෙවන ලද මුදල කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රමාණවත් සේවකයන් පිරිසක් සිටින බැවින් කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවාගැනීම අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2018/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව,—

(i) වර්ෂ 2015 සිට මේ දක්වා සමෘද්ධි සහනාධාරලාභීන් සංඛ්‍යාව;

(ii) එම කාල සීමාව තුළ දිස්ත්‍රික්කයේ සවිබලගන්වන ලද සමෘද්ධි සහනාධාරලාභීන් සංඛ්‍යාව;

(iii) එසේ සවිබලගැන්වීමෙන් සමෘද්ධි සහනාධාර වැඩසටහනෙන් ඉවත් කරන ලද සමෘද්ධි සහනාධාරලාභීන් සංඛ්‍යාව;

(iv) ඉවත් කරන ලද සමෘද්ධි සහනාධාරලාභීන් වෙනුවට අලුතින් සමෘද්ධි සහනාධාර ලැබීමට සුදුසුකම් ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (iv)හි සඳහන් පුද්ගලයන්ට සමෘද්ධි සහනාධාරය කඩිනමින් ලබාදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2695/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹුල්ල පූජාභූමි සංවර්ධන වැඩසටහන යටතේ ඉඩම් අහිමි වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ දක්වා ඉඩම් කොටස් ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව හා ඔවුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් කොටස් ලබා ගන්නා ලද සමහර පුද්ගලයන් විසින් ඒවා නීති විරෝධී අයුරින් අලෙවි කර ඇති ඇති බව දන්නේද;

(iv) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2884/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට මත්පැන් නිෂ්පාදනය කරනු ලබන නීත්‍යානුකූල ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම, ලිපිනය, ආයතනය හිමිකරුගේ නම, සහ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වර්ෂ 2020 සිට මේ දක්වා ඉහත සඳහන් එක් එක් ආයතනය විසින් ගෙවා ඇති බදු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ආයතන විසින් ගෙවිය යුතු හිඟ බදු මුදල් තිබේද;

(v) එසේ නම්, එම බදු මුදල් අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3667/2023

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට ,— (1)

(අ) (i) 2004.12.27 වන දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වික්ටෝරියා නේවාසික කළමනාකරණ කාර්යාලයේදී පවත්වන ලද ඉඩම් කච්චේරිය මඟින් ඉඩම්ලාභීන් ලෙස තෝරා පත් කරනු ලැබූ පුද්ගලයන් 44 දෙනෙකු සඳහා රජවැල්ල සහ රජවැල්ල-උතුර යන ජනාවාසවලින් පර්චස් 10 සහ පර්චස් 15 ප්‍රමාණයේ ඉඩම් කැබලි ලබා දුන් බවත්;

(ii) පර්චස් 10 සහ පර්චස් 15 ප්‍රමාණයේ ඉඩම් කැබලි සඳහා පිළිවෙළින් රුපියල් ලක්ෂ තුන සහ ලක්ෂ හතර බැගින් තක්සේරු වටිනාකමක් ගෙවීමට නියම කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අදාළ ඉඩම්ලාභීන්ගෙන් ඉහත සඳහන් තක්සේරු වටිනාකම අයකර ගෙන එම ඉඩම් සඳහා කඩිනමින් ඔප්පු නිකුත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ඔක්තෝබර් 18 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1462/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සුරාබදු දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) සුරාබදු දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන එම දෙපාර්තමේන්තුවට අයත් සේවකයන් සංඛ්‍යාව සහ ඒකාබද්ධ සේවයට අයත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සුරාබදු දෙපාර්තමේන්තුවට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධාරීන්ට සහ කණිෂ්ඨ සේවකයන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒකාබද්ධ සේවයට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධාරීන්ට සහ කණිෂ්ඨ සේවකයන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1511/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ අලුතින් ලියාපදිංචි කර ඇති ත්‍රීරෝද රථ සංඛ්‍යාව සහ උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාලය තුළ වැඩිම ත්‍රී රෝද රථ සංඛ්‍යාවක් ලියාපදිංචි කර ඇති පළාත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1549/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සිදු වූ ස්වභාවික ව්‍යසන හේතුවෙන් ඉඩම් අහිමි වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ලබා දීම සඳහා විකල්ප ඉඩම් හඳුනාගෙන තිබේද;

(iii) එම ඉඩම් පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් පුද්ගලයන් අතරින් මේ වනවිට විකල්ප ඉඩම් ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) සෙසු පුද්ගලයන්ට විකල්ප ඉඩම් ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1584/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1988 - 1989 කාල පරිච්ඡේදයේදී රජයේ තැපැල් කාර්යාල විනාශ කරනු ලැබුවේද;

(ii) එසේ නම්, ඉහත කාල පරිච්ඡේදයේදී විනාශ කරනු ලැබූ රජයේ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ විනාශ කරනු ලැබූ එක් එක් තැපැල් කාර්යාලය පිහිටුවා තිබූ ප්‍රදේශය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1622/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේදී මහේස්ත්‍රාත් අධිකරණ මගින් දඩ මුදල් වෙනුවෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත එවන ලද රු.7,676,874/- ක් වටිනා චෙක්පත් 154ක් එම අධිකාරිය විසින් නියමිත කාලය තුළදී නිෂ්කාශනය කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම චෙක්පත් කල් ඉකුත් වී නැවත අධිකරණ වෙත යවා ඇති බව දන්නේද;

(ii) ඉහත සඳහන් චෙක්පත් 154 නියමිත කාල සීමාව තුළ නිෂ්කාශනය කර ගැනීමට එම අධිකාරිය කටයුතු නොකිරීම සඳහා හේතු වූ කරුණු කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(v) නැවත අධිකරණ වෙත යවා ඇති ඉහත සඳහන් චෙක්පත් 154 වෙනුවට මේ වනවිට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ලැබී ඇති චෙක්පත් සංඛ්‍යාව සහ එම එක් එක් චෙක්පතේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1642/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සිටින කිරි ගවයන් සංඛ්‍යාව කොපමණද;

(ii) වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන දියර කිරි ලීටර් ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට දියර කිරි ආනයනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2019 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති කිරිපිටි ප්‍රමාණය සහ ඒ සඳහා වැය කර ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1682/2023

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පල්ලමඩු-සන්නාර් ප්‍රදේශයේ රජයේ ඉඩම් විශාල ප්‍රමාණයක් පවතින බවත්;

(ii) එම ඉඩම් ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට ලබා දෙන ලෙස දීර්ඝ කාලයක සිට ඉල්ලීම් කරනු ලබන බවත්,

(iii) එම ඉඩම් සඳහා විවිධ පුද්ගලයන් විසින් පිඹුරුපත්, ලේඛන හෝ සාක්ෂි කිසිවක් නොමැතිව ඔප්පු පමණක් ඉදිරිපත් කරමින් හිමිකම්පාන බවත්,

(iv) එම ඔප්පුවල නිරවද්‍යතාවය සනාථ කර ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඒවා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවට යවා ඇති බවත්,

එතුමා දන්නෙහිද?

(ආ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ, මාන්තෙයි බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පවතින රජයේ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) සන්නාර් සහ ඊච්චලවක්කෙයි ප්‍රදේශයේ ජනතාවට එම ප්‍රදේශයේ පවතින රජයේ ඉඩම් ලබා දෙන්නේද;

(iii) පිඹුරුපත්, ලේඛන හෝ සාක්ෂි කිසිවක් නොමැතිව ඉදිරිපත් කරනු ලබන ඔප්පු පමණක් එම ඉඩම් සඳහා වලංගු වන්නේද;

(iv) ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යවා ඇති උක්ත ඔප්පු සම්බන්ධයෙන් අදාළ තීරණ ලබා දෙනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1763/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය යටතේ ලෝක බැංකුවෙන් ලබා ගෙන ඇති ආධාර මුදල කොපමණද;

(ii) එම මුදලින් කොහු ආශ්‍රිත නිෂ්පාදනවල අගය වැඩිදියුණු කිරීම සඳහා යෙදවූ මුදල කොපමණද;

(iii) මේ වනවිට එම ව්‍යාපෘතියේ ඉතිරි වී ඇති ප්‍රතිපාදනය එක්සත් ජනපද ඩොලර්වලින් කොපමණද;

(iv) එම ප්‍රතිපාදන කෘෂිකර්ම ව්‍යාපෘති සඳහා ඉදිරියේදී ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1804/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, පළාත් සභා පාලනය යටතේ පවතින පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති හා සහකාර විදුහල්පති ලෙස සේවය කරනු ලබන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරි නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත පාසල් අතරින් ශ්‍රේණිධාරි විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව හා වැඩබලන විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදුහල්පති තනතුරේ වැඩබලන උප ගුරුවරුන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා තීරණයක් ගෙන තිබූ බව දන්නේද;

(ii) එසේ නම්, එම තීරණය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

(iii) එම තීරණය ක්‍රියාත්මක නොකරන්නේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2396/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ සේවය කරනු ලබන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගොවිජන සේවා මධ්‍යස්ථානවල ගොඩනැගිලි ඉතා අබලන් තත්ත්වයේ පවතින බව පිළිගන්නේද;

(iv) එම ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(v) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ඔක්තෝබර් 19 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1817/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ රිය අනතුරුවලින් මරණයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකාවේ රිය අනතුරු සංඛ්‍යාව ඉහළ ගොස් තිබේ නම්, ඒ සඳහා බලපාන ලද හේතු සාධක කවරේද;

(iii) රිය අනතුරු අවම කිරීම සඳහා මේ වනතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2535/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කින්නියා පොලිස් ස්ථානය ස්ථාපනය කරන ලද දිනය කවරේද;

(ii) ඉහත පොලිස් ස්ථානය ස්ථාපනය කර ඇති ඉඩම හිමි පාර්ශ්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කින්නියා පොලිස් ස්ථානය දීර්ඝ කාලයක සිට පුද්ගලික පාර්ශ්වයක් සතු ඉඩමක පවත්වාගෙන යාම හේතුවෙන් එම පොලිස් ස්ථානය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නොහැකි වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත පොලිස් ස්ථානය සඳහා රජයේ ඉඩමක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ලබා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2579/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති විවිධ සේවා සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමිති විසින් සපයනු ලබන සේවා කවරේද;

(iii) දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශික වැඩිම සංඛ්‍යාවක් ස්ථාපිත කර ඇති ප්‍රදේශය කවරේද;

(iv) පුළුල් මහජන සේවාවක් ලබා දීම සඳහා සමූපකාර ව්‍යාපාරය මෙහෙයවීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2623/2023

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2848/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ලංකා ධීවර සංස්ථාව සතු ශීතාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශීතාගාර ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) එම එක් එක් ශීතාගාරයේ ගබඩා ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ශීතාගාර බදු පදනම මත පෞද්ගලික අංශයට ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ආයතන තෝරාගන්නා ලද ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2971/2023

ගරු හේෂා විතානගේ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දඹදිව වන්දනා චාරිකා සංවිධානය කරනු ලබන ලියාපදිංචි ආයතන හා ඒවායේ ලිපිනයන් ශ්‍රී ලංකාවේ එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2015 සිට 2018 දක්වා දඹදිව වන්දනා කරන ලද ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දඹදිව වන්දනා චාරිකා සංවිධානය කරනු ලබන සමහර ආයතන එම වන්දනාකරුවන්ගේ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග අනුගමනය නොකරන බව දන්නේද;

(iv) ඒ හේතුවෙන් එම වන්දනාකරුවන් දැඩි දුෂ්කරතාවයට පත්වන බව පිළිගන්නේද;

(v) වන්දනාකරුවන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමට සහ දඹදිව වන්දනා චාරිකා සංවිධානය කරනු ලබන ආයතන නියාමනය කිරීමට විධිමත් ක්‍රියාමාර්ග සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3080/2023

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2010 සිට 2015 දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින්—

(i) නිකුත් කරන ලද මාසික සහ වාර්ෂික වාර ප්‍රවේශ පත්‍ර සඳහා;

(ii) ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරින්ට නිකුත් කරන ලද වාර ප්‍රවේශ පත්‍ර සඳහා;

(iii) ක්‍රියාත්මක කරන ලද ''නිසි සැරිය'', ''ගැමි සැරිය'' හා ''සිසු සැරිය'' ප්‍රවාහන සේවා සඳහා;

මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද සහනාධාර මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම සහනාධාර මුදල් මහා භාණ්ඩාගාරය විසින් මේ වනවිටත් ලබා දෙන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3098/2023

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනු කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සම්වල තීන්දුව ප්‍රකාශයට පත් කරන ලද දිනය කවරේද;

(ii) එම නඩු තීන්දුව මඟින් වරදකරුවන් කර ඇති එක් එක් පුද්ගලයාගේ නම, ලිපිනය, මේ වනවිට දරනු ලබන තනතුර සහ ඉහත නඩු තීන්දුව ලබා දෙන අවස්ථාව වන විට දරන ලද තනතුර හා සේවා ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පුද්ගලයන් මේ වනවිටත් උක්ත ආයතනවල ඉතා ඉහළ තනතුරු දරමින් සිටීම, ඉහත අධිකරණ තීන්දුව ක්‍රියාත්මක කිරීමට බාධාවක් බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3155/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා පොලීසියේ, පොලිස් පරීක්ෂක, පොලිස් සැරයන් සහ පොලිස් කොස්තාපල් යන එක් එක් තනතුරේ සේවය කරනු ලබන නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් තනතුරේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත තනතුරුවල සේවය කරනු ලබන නිලධාරින්ට උසස්වීම් ලබාදීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) පොලිස් සැරයන් තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුරට උසස් වීම සඳහා ගත වන කාලය කොපමණද;

(v) ශ්‍රී ලංකා පොලීසියට ආධුනික පොලිස් කොස්තාපල්වරුන් බඳවාගැනීමේදී, මේ වනවිට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3578/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට විදේශ රටවල සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) වැඩිම ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සිටින රට සහ අඩුම ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සිටින රට අනුව එම ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ශ්‍රමිකයන් සේවය කරනු ලබන රටවල් අතරින් ශ්‍රී ලංකාව විසින් තානාපති සබඳතා පවත්වන සහ තානාපති සබඳතා නොපවත්වන රටවල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුභසාධනය උදෙසා ඔවුන් සේවය කරනු ලබන රටවල් සමඟ තානාපති සබඳතා පැවැත්වීම වැදගත් වන බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ඔක්තෝබර් 20 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3107/2023

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) යාපනය, නෙඩුන්තීවු දූපතේ පිහිටා ඇති සංචාරක ස්ථානවල නම් කවරේද;

(ii) වර්ෂ 2010 සිට 2020 දක්වා නෙඩුන්තීවු දූපතට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සංචාරකයන් ආකර්ශණය කර ගත හැකි ආකාරයෙන් ඉහත සංචාරක ස්ථාන නඩත්තු කරනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් සංචාරක ස්ථාන අතරින් මේ වනවිට ප්‍රතිසංස්කරණය කර ඇති සංචාරක ස්ථානවල නම් කවරේද;

(ii) එම සංචාරක ස්ථාන ප්‍රතිසංස්කරණ කිරීම සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) මේ වනතෙක් එම සංචාරක ස්ථාන ප්‍රතිසංස්කරණය කර නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) නෙඩුන්තීවු දූපතේ පිහිටා ඇති සංචාරක ස්ථාන විධිමත් ලෙස ආරක්ෂා කිරීමට සහ නඩත්තු කිරීමට අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3174/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2017 සිට 2021 දක්වා වී මිලදී ගැනීම සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල;

(ii) එක් එක් දිස්ත්‍රික්කයන් සඳහා වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන්;

(iii) එක් එක් දිස්ත්‍රික්ක වෙත වෙන් කරන ලද මුදල, මුළු මුදලේ ප්‍රතිශතයක් ලෙස;

(iv) ඉහත කාලය තුළ මිලදී ගන්නා ලද වී ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වී මිලදී ගැනීම සඳහා 2022 වර්ෂයේ රජය විසින් වෙන් කරන ලද මුදල;

(ii) 2022 වර්ෂයේ මේ වනවිට මිලදී ගෙන ඇති වී ප්‍රමාණය;

(iii) ඒ සඳහා වැය කරන ලද මුදල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3234/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ ''නිකුතු සුරක්ෂිතාගාරයේ'' තැන්පත් කර තිබූ රුපියල් මිලියන 5ක මුදලක් අතුරුදහන් වී තිබේද;

(ii) ඊට වගකිව යුතු නිලධාරීන් අනාවරණය කර ගැනීම සඳහා විමර්ශන සිදු කර තිබේද;

(iii) මේ වනවිට, එම විමර්ශනවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ''නිකුතු සුරක්ෂිතාගාරයේ'' ආරක්ෂිත කැමරා සවිකර තිබේද;

(ii) එම ආරක්ෂිත කැමරා පද්ධතියේ පටිගත වී ඇති දර්ශන සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර තිබේද;

(iii) ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කර ඇති මුදල් ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3335/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2019 නොවැම්බර් මාසයෙන් පසු පත්කර ඇති එක් එක් ජනාධිපති කාර්ය සාධක බලකායේ නම, එය පත්කරන ලද දිනය , සහ මේ වනවිට පවත්වා ඇති රැස්වීම් සංඛ්‍යාව, සාමාජිකයන්ගේ නම්, ඔවුන්ගේ තනතුරු, සුදුසුකම්, ගෙවනු ලබන වැටුප්, දීමනා සහ ලබා දෙන වෙනත් පහසුකම්;

(ii) එම එක් එක් කාර්ය සාධක බලකාය තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන ලද අරමුණු;

(iii) එම අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3338/2023

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1980 ජූලි වැඩ වර්ජනයට සහභාගී වී රැකියා අහිමිවූවන්ට සහන සැලසීමේ වැඩ සටහන යටතේ 2015.12.31 දින දක්වා එක් වැඩවර්ජකයෙකුට ගෙවූ රු.6000.00ක් වූ මාසික දීමනාව වෙනුවට 2016 වර්ෂයේ අයවැය යෝජනා පරිදි එක් වරක් පමණක් ගෙවා අවසන් කරනු ලබන රු.250,000.00ක මුදලක් ලබා දීමට තීරණය කරන ලද බවත්;

(ii) ඒ අනුව, 2022 වර්ෂයේ දෙසැම්බර් මාසය දක්වා වයස අවුරුදු 65 සම්පූර්ණ වූ වැඩවර්ජකයන්ට ඉහත මුදල නිසි පරිදි ගෙවා ඇති බවත්;

(iii) 2023 වර්ෂයේ ජනවාරි මාසයේ සිට මේ දක්වා වයස අවුරුදු 65 සම්පූර්ණ වූ කිසිදු වර්ජකයෙකුට එම මුදල ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(iii)හි සඳහන් වැඩවර්ජකයන්ට එම මුදල නැවත ගෙවීම ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(ii) ඔවුන්ට ඉහත මුදල නොගෙවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3350/2023

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රිජ්වේ ආර්යා ළමා රෝහලේ මේ වනවිට සේවය කරනු ලබන ප්‍රධාන සුළු සේවා පාලකවරයා වර්ෂ 16කට අධික කාලයක් එම රෝහලේ සේවය කරමින් සිටින බවත්;

(ii) ඔහු විසින් සිදු කරනු ලබන විවිධ අක්‍රමිකතා සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පැමිණිලි විශාල සංඛ්‍යාවක් ලැබී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පැමිණිලි සම්බන්ධ පරීක්ෂණ අතරමග නතර කිරීමට හේතු කවරේද;

(ii) ඉහත සේවකයා සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමට හේතු කවරේද;

(iii) ඔහු විසින් සිදු කරනු ලබන විෂමාචාර සහ අක්‍රමිකතා නැවැත්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3355/2023

ගරු ජයන්ත සමරවීර මහතා,— බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුරාවිද්‍යා ප්‍රදේශයක් ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට හඳුනාගෙන ඇති පුරාවිද්‍යා ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පුරාවිද්‍යා ප්‍රදේශයේ නම, පිහිටා ඇති පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වන විට ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇති පුරාවිද්‍යා ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් පුරාවිද්‍යා ප්‍රදේශයේ නම, එය පිහිටා ඇති පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පුරාවිද්‍යා ප්‍රදේශයක් ලෙස මේ වනතෙක් ගැසට් මඟින් ප්‍රකාශයට පත් නොකරන ලද පුරාවිද්‍යා ප්‍රදේශ ගැසට් කිරීම සඳහා කාල රාමුවක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම කාල රාමුව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3366/2023

ගරු මයන්ත දිසානායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු දින සිදු කරන ලද ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයන් වෙනුවෙන් ඔවුන්ගේ පවුල්වලට වන්දි ලබා දී තිබේද;

(ii) එම ප්‍රහාරය හේතුවෙන් දෙමව්පියන් අහිමි වූ දරුවන් රැකබලාගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එම දරුවන් රැකබලා ගැනීම සඳහා ඔවුන්ගේ ඥාතීන් වෙත මාසික දීමනාවක් ගෙවනු ලබන්නේද;

(iv) එම ප්‍රහාරය හේතුවෙන් ආපදාවට ලක් වී සිටින පුද්ගලයන් සඳහා රජයේ අනුග්‍රහයෙන් විදේශ ප්‍රතිකාර ලබා දීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3483/2023

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතු ඉඩම්, කිරි ගොවිපොළ පිහිටුවීම සඳහා ලබා දීමට 2021.09.06 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සඳහා "ගලබොඩ" සහ "මවුන්ට් ජීන්" යන එක් එක් වත්තෙන් ලබා ගනු ලබන ඉඩම් අක්කර ප්‍රමාණය;

(ii) එම ඉඩම් ලබා ගනු ලබන එක් එක් සමාගම, එම එක් එක් සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ජාතිකත්වය (ස්වදේශීකද / විදේශිකද);

(iii) ඉහත එක් එක් සමාගම විසින් ගෙවනු ලබන අත්තිකාරම් මුදල සහ ඉඩම් අක්කරයක වාර්ෂික බදු මුදල;

(iv) ඉහත වතුවල කිරි ගොවිපොළ සඳහා වෙන් කරනු ලබන භූමියේ ඇති පේලි නිවාස හා සිද්ධස්ථාන සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත වතු පිහිටා ඇති දිස්ත්‍රික්කවල ඇති රජයේ කිරි ගොවිපොළ සතුව ප්‍රමාණවත් ඉඩම් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, තේ වගා කළ හැකි ඉඩම්, කිරි ගොවිපොළ සඳහා ලබාදීමේ පදනම කවරේද;

(iii) මෙම කිරි ගොවිපොළ පිහිටුවීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3505/2023

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් අයවැයෙන් වෙන් කළ මුළු ප්‍රතිපාදනය කොපමණද;

(ii) ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදනය ඉහත මුළු ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත ප්‍රතිපාදනයෙන් ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා මේ වනවිට නිකුත් කර ඇති මුදල, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2019 සිට 2023 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වෙන් කළ සහ නිකුත් කළ ප්‍රතිපාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) 2021 සිට 2023 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සඳහා වෙන් කළ සහ නිකුත් කළ ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා.57/2023

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා
ගරු වජිර අබේවර්ධන මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු සංජීව එදිරිමාන්න මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා
ගරු ජයන්ත කැටගොඩ මහතා
ගරු ජගත් සමරවික්‍රම මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු නීතිඥ මධුර විතානගේ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
ගරු ඩී. බී. හේරත් මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු උදයකාන්ත ගුණතිලක මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා,— පාස්කු ඉරු දින මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය පිළිබඳව බ්‍රිතාන්‍යයේ "චැනල් 4" නාලිකාව විසින් විකාශය කරන ලද වැඩසටහන මඟින් එල්ල කරන චෝදනා විමර්ශනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— 2019 අප්‍රේල් 21 දින 269 දෙනෙකුට දිවි අහිමි කරමින් 500කට වැඩි පිරිසකට තුවාල සිදු කරමින් සිදු කරන ලද පාස්කු ඉරුදින මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයෙන් මෙරට ආර්ථිකයටද විශාල බලපෑමක් එල්ල වූ අතර මේ පිළිබඳව සොයා බැලීමට ජනාධිපති පරික්ෂණ කොමිෂන් සභාවක් ඇතුළු විවිධ මට්ටමේ පරීක්ෂණ කටයුතු ක්‍රියාත්මක වූ හෙයින්ද;

2023 සැප්තැම්බර් 05 දින බ්‍රිතාන්‍යයේ "චැනල් 4" රූපවාහිනී නාලිකාව විසින් විකාශය කරන ලද "Sri Lanka's Easter Bombings – Dispatches" නමැති වැඩසටහන මඟින් ජ්‍යෙෂ්ඨ හමුදා බුද්ධි අංශ නිලධාරීන් සහ ඇතැම් දේශපාලඥයින් 2019.04.21 දින මරාගෙන මැරෙන ප්‍රහාරය දියත් කරන ලද ත්‍රස්තවාදීන් සමඟ සබඳතා පැවැත් වූ බවට චෝදනා කොට ඇති හෙයින්ද;

එවකට නීතිපති ජනාධිපති නීතිඥ දප්පුල ද ලිවේරා මහතාට, සියලු විමර්ශන ද්‍රව්‍ය, විමර්ශන වාර්තා, සාක්ෂි සහ වෙනත් එවැනි තොරතුරු සඳහා සෘජුවම ප්‍රවේශය ලබා ගැනීමට හැකියාව තිබියදීත්, සිය ධුරයෙන් විශ්‍රාම ගැනීමට ආසන්නයේ 2021 මැයි 17 දින "නිවුස් ෆස්ට්" සමඟ සාකච්ඡාවකදී මෙම ප්‍රහාරය පසුපස විශාල කුමන්ත්‍රණයක් පවතින බවත්, නවුෆර් මවුලවි මෙම කුමන්ත්‍රණයේ ප්‍රධාන චරිතයක් මෙන්ම කණ්ඩායමේ නායකයා වුවත් මහ මොළකරු ඔහු බවට නිශ්චිතව කිව නොහැකි බවත්, සහරාන් හෂීම් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීමට තීරණය කළ ද ඔහුත් මෙම කුමන්ත්‍රණකාරී පුද්ගලයින්ගෙන් එක අයෙකු පමණක් බවත් ප්‍රකාශකර ඇති හෙයින්ද;

මේ අනුව පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධව මෙතෙක් හෙළි නොකළ යම් තොරතුරක් එවකට නීතිපති ජනාධිපති නීතිඥ දප්පුල ද ලිවේරා මහතා ද දැන සිටින බවට සාධාරණ සැකයක් මතුවන අතර ඔහුගේ ප්‍රකාශයන් සහ ඒ සඳහා පාදක වූ කරුණු නිසි පරිදි අනාවරණය කරගත යුතු වන හෙයින්ද; සහ

"චැනල් 4" වීඩියෝව නිකුත්වීමත් සමඟ 2023.09.08 දින ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුව අමතමින් හඬපටයක් ඉදිරිපත් කරමින් මෙම සිදුවීම සම්බන්ධව විවිධ මට්ටමේ විනිසුරුවරුන්ට සහ නිලධාරීන්ට ද චෝදනාවක් එල්ල කරන ලද අතර යූටියුබ් මඟින් විඩියෝ මුදාහරින අජිත් ධර්මපාල නැමති පුද්ගලයා ද විවිධ පුද්ගලයන්ගේ නම් සඳහන් කරමින් ආන්දෝලනාත්මක කරුණු සමාජගත කොට ඇති හෙයින්;

උක්ත "චැනල් 4" වැඩසටහනෙන් සහ අනෙකුත් පාර්ශ්ව චෝදනා කරනු ලබන නිලධාරීන් සහ දේශපාලඥයින් මරාගෙන මැරෙන ප්‍රහාරය දියත් කරන ලද ත්‍රස්තවාදීන් සමඟ සබඳතා පැවැත් වූ බවට හෝ කුමන්ත්‍රණය කළ බවට හෝ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමකට අදාළ කරුණු ඇත්දැයි සොයා බැලීමට හා ශ්‍රී ලංකා පොලිසිය විසින් මෙතෙක් සිදුකරන ලද විමර්ශන කටයුතු අධ්‍යයනය කොට පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවේ සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් පත්කළ යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් එකොළොස් දෙනෙකුගෙන් (11) සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතුය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස දෙකක (02) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළතදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.